# තල්පතින් ගව කුරි

වයි. කේ. තිස්ස බණ්ඩාර

වෙනත් කාර්යයක් සඳහා මහනුවර ප්‍රදේශයේ පැරණි පුස්කොළ පොත් අධ්‍යයනයෙහි නිරත ව සිටිනාවිට පශු වෛද්‍ය පොතක කොටසක් වර්තමාන ලේඛකයාට හමු විය. ස්ථානය අස්ගිරි මහා විහාරයේ ආදාහන මළුව ගෙඩිගේ විහාරස්ථානයයි. මෙම විහාරයේ පුස්කොළ පොත් එකතුවට අමතර ව අබලි සහ කලවම් වූ (මිශ්‍ර) පත් ඉරු රැසක එකතුවක් ද විය. ඒ අතර ඇති පත් ඉරු එකින් එක පරීක්ෂා කිරීමේ දී පත් ඉරු එකතුවක් කෙරෙහි විශේෂ අවධානය යොමු විය. එම එකතුව හුයකින් දවටා තිබිණ. වෙන ම පොතක් හැටියට පිළිසකර කිරීමට හැකියාව ඇත්දැයි පරීක්ෂා කිරීමේ දී මෙය කලවම් ව ඇති එකතුවක් බව පැහැදිලි විය. එහෙයින් පත් ඉරු අංකනය කිරීමේ ශිල්ප ක්‍රම අනුව පෙළ ගැස්වීමේ දී දෙපැත්ත ලියූ පත් ඉරු 39ක එකතුවක් (ක-ගු) සකසා ගත හැකි විය.

පෙළ කියවා ගෙන යාමේ දී පැහැදිලි වූයේ මෙය පොතක කොටසක් බවයි. දැනට මෙහි පත් ඉරු 39ක් ඇති අතර දිගින් සෙන්ටිමීටර් 23ක් හා පළලින් සෙන්ටිමීටර් 5ක ප්‍රමාණයෙන් යුක්ත වෙයි. අඟලකට අකුරු 5-6 ප්‍රමාණයෙන් පිහිටන අතර භාෂාව හා අක්ෂර සිංහල වේ. පත් ඉරු කිහිපයක කෙළවරවල් සතුන් විසින් කා දමනු ලැබ ඇති හෙයින් ඇතැම් තැනෙක කියවා ගැනීම අපහසු ය. ඉතා දුර්වර්ණ ව සහ අපැහැදිලි තත්ත්වයෙන් පැවතිය ද ආයාසයෙන් කියවා ගැනීමට හැකි වෙයි. කම්බ දෙකක් සකියෙක් සහිත හුයක් නො මැති මෙය පොතක කොටසක් වශයෙන් සැලකිය හැකි, අඩු ම තරමින් දැනට වසර සියය ඉක්මවා ඇති වැදගත් ලේඛනයක් බව හැඳින්විය හැකි ය. පැරණි වෛද්‍ය ග්‍රන්ථ අතරෙහි පශු වෛද්‍ය ග්‍රන්ථ ඉතා අඩු ය. හේතුව රහස් ක්‍රමයක් ලෙස මෙම වෙදකම් පරපුරින් පරපුරට පවත්වා ගෙන ගියෙන් ලිඛිත තොරතුරු මඳ බවක් පෙන්වයි.


මෙම පත් ඉරු එකතුව තුළින් පැරණි පශු වෛද්‍ය ක්‍රමයේ ගවයින් සඳහා වූ වෙදකම් රැසක් හා රෝගවල ස්වරූපය ද මැනවින් දක්නා ලැබේ. ගවයෙකුගේ ස්වරූපය අනුව ඔහුගේ වංශය, ආයු කාලය ආදිය ද මෙහි සඳහන් වේ. විශේෂයෙන් ම රෝග සඳහා ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් එකල යොදා ගෙන ඇත්තේ සිරුරේ කුරි (හන සලකුණු) පිළිස්සීමයි. ගවයින්ගේ කුරි පිළිස්සීම කාලාන්තරයක් තිස්සේ ලංකාවේ පැවති බවට සාධක ඇත. මේවා ඇතැම්විට ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනත් ලක්ෂණ සහිත ද වෙයි. වර්තමානයේ මෙම සම්ප්‍රදායික කුරි පිළිස්සීමේ ක්‍රමය අභාවයට යමින් පවතී. කුරි යෙදුව ද ඇතැම් තැනෙක ගවයාගේ අයිතිය හැඟවෙන පරිදි කිසියම් අයකුගේ නාමයේ මුල් අකුරු ඉංග්‍රීසි හෝ සිංහලයෙන් යොදනු පෙනේ. නිදසුන් : J. සුනීතා. එහෙත් පෙර

සමයේ දී සිදුකර ඇත්තේ රෝග සඳහා කුරි සලකුණ යෙදීමයි.


විවිධ රූප පෙන්වන සලකුණු රැසක් මේ කුරි අතර වේ. මෙයින් ඇතැම් ඒවා දෙමළ, සිංහල අක්ෂරවලට ආසන්න සමීප බවක් ද දක්වයි. අනෙක්වා රේඛාමය සටහන් ය. ගවයාගේ සිරුරෙහි විවිධ තැන්වල පුළුස්සනු ලබන මෙම කුරි (හන සලකුණු) සලකුණු හතලිහක් ඉහත පත් ඉරු එකතුවෙන් හඳුනා ගනු ලැබිණි. ඒවා පිළිබඳ විස්තර හා සටහන් රූප පහත දැක්වේ.

| | | |
|---|---|---|
| වෙසක් මසට කී ලෙසට දැලේ පුළුශ්ශනු(පුලුස්සනු) | (රූප අංක 01) | කා පත් ඉරුව |
| පොසොන් මසට කී ලෙඩට පිළිෂ්ෂුන්(පිළිස්සුන්) | (රූප අංක 02) | (එම) |
| ඇසල මසට කී ලෙඩට පිලිස්සුන් දෑලේ | (රූප අංක 03) | (එම) |
| බිඬර (බිනර)මසට කී ලෙඩට පිළිස්සුන් දෑලේ | (රූප අංක 04) | (එම) |
| දුරුතු මසට | (රූප අංක 05) | (එම) |
| මැදින් මසට කී ලෙඩට පිලිස්සුම් දෑලේ | (රූප අංක 05) | (එම) |
| බක් මසට | (රූප අංක 06) | (එම) |


මෙහි විවිධ රෝග සහ තවත් කුරි (හන) ලකුණු කිහිපයක් එම පත් ඉරුවේත් කඃ, ඛ, ඛා, ඛි, ඛී, ඛෘ, ඛෲ, ඛඃ යන පත් ඉරු වලත් සඳහන් වේ. මින් ඛා පත් ඉරුවේ සලකුණු ප්‍රමාණයෙන් වැඩි ය. ඉහත විස්තරයට අදාල ව කුරි (හන) ලකුණු තිස් හයක් (36) මෙහි ම විසින් මූලික වශයෙන් ඇඳින ලදුව පල කරනු ලැබේ.(රූප සටහන් පරිමාණයට නොවේ.)




7




8




9



10




11




12



13




14




15




16



17




18



19




20




21



22




23




24




25



26




27



28




29




30



31



32




33



34



35



36

